# තෝමස් ඇක්වයිනාස්ගේ දෙවියන් පිළිබඳ අචින්ත්‍යත්ව විග්‍රහය (Incomprehensibility of God), ශූන්‍යතාවේ විරෝධාභාසය හා ඩෙරීඩාගේ නිෂ්ප්‍රාය පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්

**ජේ. ඩී. ඒ. කුමාර**
**පේරාදෙණිය විශ්වවිද්‍යාලය.**
ashokakumara@gmail.com

තෝමස් ඇක්වයිනාස් මධ්‍යතන යුරෝපයේ කතෝලික පූජකවරයෙකි. ෂාක් ඩෙරීඩා 20 වැනි සියවසට අයත් ප්‍රංශ දාර්ශනිකයෙකු වන අතර නාගාර්ජුන ක්‍රිස්තු වර්ෂ දෙවැනි සියවසට අයත් ඉපැරණි ඉන්දියානු බෞද්ධ දාර්ශනිකයෙකි. දෙවියන් වහන්සේගේ අචින්ත්‍ය බව (incomprehensibility) පිළිබඳ තෝමස් ඇක්වයිනාස් අදහසක් ගෙන ආ අතර නාගාර්ජුනයන් විසින් සංසාරය සහ නිවන අතර වෙනසක් නොවන බව හා ස්වරූපය ම ය ශූන්‍යය, ශූන්‍යය ම ය ස්වරූපය යන ලෙසින් විරෝධාභාසයක් ගොඩනඟනු ලැබිණ. දෙවියන් පිළිබඳ අචින්ත්‍ය භාවය ගොඩනැගෙන්නේ සද්භාවවේදී අසමානුපාතිකත්වය (ontological disproportion) නිසා බව තෝමස් ඇක්වයිනාස් පැවසීය. මෙම සද්භාවී අසමානුපාතිකත්වය නිර්මාණය වන්නේ අපරිමිත වූ දෙවියන් පිළිබඳ සාරය සහ පරිමිත වූ නිර්මිත චින්තාව අතර බවයි ඇක්වයිනාස් සඳහන් කරන්නේ. එනයින් දිව්‍යමය සාරය කිසිදු ආකාරයකින් මිනිසාට ළඟාකර ගත නොහැකි බව පැහැදිලි වේ. එනයින්, එම පැහැදිලි කළ නොහැකි කලාපය තුළ නිෂ්ප්‍රාය සඳහා ඉඩ ඇත. ඩෙරීඩා පවසන පරිදි හොඳ සහ නරක දෙක ම එකවර ප්ලේටෝ දැක් වූ ෆාමර්කෝන්හි ඇත. එබැවින්, එය සංදර්භය මත පාදක ව අර්ථය ගොඩනැගෙන්නකි. ෂාක් ඩෙරීඩා විසින් යමක් පැවැත්ම සඳහා යම් ප්‍රවණතාවක් ඇත් නම් නොපැවැත්ම සඳහා එම ප්‍රවණතාව ම ඇති බවට විරෝධාභාසයක්, නිෂ්ප්‍රාය ලෙසින් හෙළි කළේය. නාගර්ජුනයන් විසින් ද මුල් බුදු සමය විසින් ද නිර්වාණය සම්බන්ධයෙන් ගෙන එන ලද විග්‍රහය වන්නේ එය අචින්ත්‍ය වූවක් බවයි. එය තර්කයේ සීමාවෙන් එපිට වූවක් බවයි. එනම් අතක්කාවචර වන බවයි. මේ අනුව පෙනී යන කරුණක් වන්නේ නිවන යනු ද දෙවියන් යනු ද දැනුමෙන් සහ තර්කයෙන් අත්පත් කර ගත නොහැකි දෙයක් බවය. එය විසංයෝජනීය අර්ථයෙන් භාෂාවෙන් එපිට වූ යමක් ඇඟවෙයි. මෙනයින්, මෙම දාර්ශනිකයන් තිදෙනාගේ සාම්‍යයක් හඳුනා ගැනීමට හැකි වන අතර ඒ පිළිබඳ මානව ශාස්ත්‍රානුකූල තුලනාත්මක අධ්‍යයනයක් මෙහි දී සිදු කෙරේ. එහි දී අර්ථ විවරණ (hermeneutics) පර්යේෂණ ක්‍රමවේදයක් ලෙස යොදා ගැණුනු අතර පර්යේෂණයේ අවසන් නිගමනය වශයෙන් අර්ථ දැක්විය නොහැකි යමක් පිළිබඳ මෙම දාර්ශනිකයන් තිදෙනා ම ඇඟවුම්කරණයක යෙදෙන බව පෙන්නුම් කෙරේ. එබැවින් ම, ඔවුන් තිදෙනා ඉදිරිපත් කරන මෙම අර්ථයන්ගෙන් විරහිත වූ අචින්ත්‍ය වූ විරෝධාභාස සඳහා විවෘත යමක් ඇත යන්න හෝ නැත යන්න හෝ ප්‍රකාශ කිරීම ම නැවත පාරභෞතිකයේ පැවැත්මක් (Metaphysics of Presence) ගොඩනැඟීමක් වනු ඇත.

**ප්‍රමුඛ පද ៖** තෝමස් ඇක්වයිනාස්; නාගාර්ජුන; ෂාක් ඩෙරීඩා